# 7. පන්දහසකට ආහාර

ජේසුස් වහන්සේ කරන පුදුම දේවල් ගැන ආරංචි වෙලා විශාල සෙනගක් උන්වහන්සේ ළඟට ආවා.

ජේසුස් වහන්සේ කන්දක් උඩට නැගලා දේශනා කළා. ගෝලයන් ද එතැනට ඇවිත් සිටියා. සවස් වූ විට සෙනඟට බඩගිනි බව ජේසුස් වහන්සේ දැක්කා.

ජේසුස් වහන්සේ : මේ සෙනඟට දැන් බඩගිනි ඇති නේද? මොවුන්ට ආහාර ලබා දෙන්නේ කොහොම දැයි සොයා බලන්න.

පිලිප් : ස්වාමීනී, අප ළඟ එතරම් මුදල් නැහැ. ඔවුන්ගේ කෑම සොයා ගන්න කියා සෙනග හරවා අරිමුද?

ජේසුස් වහන්සේ : ඔබ ම ඔවුන්ට ආහාර සපයා දෙන්න.

ඇන්ඩෲ : ස්වාමීනී, මේ දරුවා ළඟ මාළු දෙන්නෙකුත් රොටී පහකුත් තියෙනවා. ඔහු එය බෙදා ගැනීමට කැමතියි.

දරුවා : මෙන්න ස්වාමීනී මේ රොටිත්, මාළුත්



ජේසුස් වහන්සේ රොටී සහ මාළු පිළිගෙන, දේව පියාට ස්තුති කර ඒවා කඩා, බෙදා දුන් සේක. පුදුමයි! මුළු සෙනඟට ම බඩගින්න නිවා ගන්න හැකි වුණා. ඒ විතරක් ද? ඉතිරි කැබලි කූඩා දොළහකට පිරෙව්වා. ජේසුස් වහන්සේ එදා ඒ සෙනඟට බඩගින්නේ ඉන්න දුන්නේ නැහැ. අපවත් මේ වගේ බලා ගන්නවා.

## පැවරුම්

1. රොටී පහක් හා මාළු දෙකක් ගැන කියවෙන ගීතයක් ගායනා කරන්න.
2. දෙවියන් වහන්සේ අපට ලබා දී ඇති ආහාර වර්ග පහක නම් ලියන්න.